ලේකම්, මුදල් ක්‍රමසම්පාදන,...අමාත්‍යාංශය.

ලේකම්, කෘෂිකර්ම,... අමාත්‍යාංශය.

ලේකම්, ධීවර, සත්ත්ව නිෂ්පාදන,... අමාත්‍යාංශය.

ලේකම්, අධ්‍යාපන, ඉඩම්, ...අමාත්‍යාංශය.

ලේකම්,ක්‍රීඩා, හා යෞවන කටයුතු ...අමාත්‍යාංශය.

පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ - දකුණු පළාත.

පළාත් පාලන කොමසාරිස් - දකුණු පළාත.

දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

දිස්ත්‍රික් ලේකම් - ගාල්ල මාතර/හම්බන්තොට.

අධ්‍යක්ෂ ජනරාල් - දකුණු පළාත් සංවර්ධන අධිකාරිය.

මහත්මයාණෙනි,

**2024 පළමු භාගය සඳහා වූ පළාත් මිළ ගණන් හා පළාත් රේට්. ( පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයේ රී.425 හා රී.426 පරිදි )**

දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේදී පැවැත්වූ 2024.01.31 පළමු භාගය සඳහා පළාත් මිළ කමිටුව හා 2024.02.09 දින පැවති රේට් කමිටුව අනුව අදාල අනුමත මිල ගණන් 2024.02.09 දින දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ www.cs.sp.gov.lk වෙබ් අඩවියට ඇතුලත් කර ඇති අතර මෙම මිළ ගණන් 2024.02.09 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වන බව දන්වමි.

2. තවද ගාල්ල/මාතර/හම්බන්තොට දිස්ත්‍රික්ක තුනට අනුරූප වන මිළ ගණන් වෙන් වෙන්ව ඇතුලත් කර ඇත.

3. තවද, BSR, ISR, HSR වලට අදාලව සැකසූ මිල ගණන් සඳහා වන Rate Schedule වල සාරාංශයද ඇතුලත් කර ඇත.

4. ඇස්තමේන්තු සකස්කිරීමේ සීමාවන්, අනුමත කිරීමේ සීමාවන් හා ගිවිසුම් වලට එළඹීමේ සීමාවන් සංශෝධනය කිරීම සම්බන්ධයෙන්වූ දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක: CSS/7/1/3 හා 2019.12.27 ප්‍රධාන ලේකම් චක්‍රලේඛ ( මුදල්) – 11/2019 හා ආණ්ඩුකාර ලේකම්ගේ අංක: G/SP/1/2/1/1/2019 හා 2019.12.27 දිනැති ලිපියේ 2.3 ප්‍රකාරව විශේෂ මිල ගණන් අනුමත කිරීමේ බලය මින් ඉදිරියටත් එම චක්‍රලේඛනය පරිදි ක්‍රියාත්මක කරනු ඇත.

5. ඒ අනුව ඒ ඒ දිස්ත්‍රක්කයේ මිල ගණන් අවශ්‍ය පරිදි ඇස්තමේන්තු කටයුතු සඳහා භාවිතා කලයුතු බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

අ. පි. බ.

පළාත් රේට් කමිටුව

සභාපති - සුමිත් අලහකෝන් මහතා ..............................
ප්‍රධාන ලේකම් - දකුණු පළාත.

සාමාජික - ඉංජි. සී.බී. අබයදීර මිය. ..............................
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( ඉංජිනේරු සේවා)වැ.බ.
දකුණු පළාත.

එන්.එම්. ආනන්ද අමරදේව මහතා. ..............................
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( මූල්‍ය කළමණාකරන)
දකුණු පළාත.

එස්.ජී. විදුර ප්‍රසන්න මහතා. ..............................
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( සැලසුම්)
දකුණු පළාත.

පී.පී. වික්‍රමසිංහ මිය. ..............................
සමාන්‍යාධිකාරී
පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය.

ඉංජි.එම්.එස්.කේ. දේවරත්න මිය. ..............................
රජයේ මාර්ග සංවර්ධන අධිකාරිය.

ඉංජි. එල්.අයි. රාමනායක මහතා. ..............................
පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව.

ඉංජි. ඕ.සී.ජයනන්ද මහතා. ..............................
ප්‍රධාන ඉංජිනේරු,
පළාත් පාලන දෙපාර්තමේන්තුව.

## 2024 – 1 භාගය පළාත් මිළ කමිටුව

## 2024.01.31 දින ප.ව. 2.00 ට දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේදී පැවති පළාත් මිල කමිටු තීරණ.

1. ගාල්ල / මාතර / හම්බන්තොට දිස්ත්‍රික්ක තුන සඳහා පැවැත්වූ දිස්ත්‍රික් මිළ කමිටු පාදක කරගෙන, ඉදිරිපත් කර ඇති මිල ගණන්, පළාත් මිළ කමිටුව මඟින් අනුමත කරන ලද අතර එම මිල දිස්ත්‍රික්ක අනුව මිළ වෙනස්කම් ඇති හෙයින් ද, එම ද්‍රව්‍ය යොදාගෙන සාදන රේට් සඳහා මිළ ගණන් දිස්ත්‍රික්ක තුන අනුව වෙන වෙනම සෑදීමට තීරණය කරන ලදී.

2. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයෙන් ඉදිරිපත් කර ඇති ද්‍රව්‍ය මිළ ගණන් සඳහා, දිස්ත්‍රික්ක තුනෙහි ඉදිරිපත් කර ඇති මිළ ගණන් 3හි සාමාන්‍ය අගය(**Average**) පළාත් මිල කමිටුව මඟින් අනුමත කරනලද අතර එම මිල ගණන් පාදක කරගෙන මිළ ගණන් සාදා ඉදිරිපත් කරන ලෙසට දන්වන ලදී.

3. දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තුමේන්තුව ඉදිරිපත් කර ඇති මිළ ගණන් මිල කමිටුවෙන් අනුමත කරන ලදී. යන්ත්‍ර සූත්‍ර වල මිල ගණන් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ඉදිරිපත් කර ඇති යන්ත්‍ර සූත්‍ර වල මිළ ගණන් සමඟ සංසංදනය කර තීරණය කරන ලද මිළ ගණන් යොදාගෙන රේට් සෑදීමට තීරණය විය.

4. දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ඉදිරිපත් කර ඇති මිළගණන් මාර්ග සංවර්ධන අධිකාරියේ මිළ ගණන් වලට වඩා වැඩි බව මාර්ග සංවර්ධන අධිකාරියෙන් පැමිණ සිටි ඉංජිනේරු D.J.I.A. තිලකරත්න මහතා පැවසීය. තවද අද දින මාර්ග සංවර්ධන අධිකාරිය 2024, 1 භාගයට මිල ගණන් ලබාගෙන නොමැති බැවද ප්‍රකාශකරණ ලදී. මාර්ග සංවර්ධන අධිකාරියෙන් නව මිල ගණන් ඉදිරිපත් කල පසුව එම මිළගණන් යොදාගෙන නව **Rates** සෑදීමටත් එතෙක් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඉදිරිපත් කර ඇති මිල ගණන් යොදාගෙන රේට් ඉදිරිපත් කිරීමටත් තීරණය කරණ ලදී.

5. ඉදිරියේදී **HSR** සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ භාවිතා කරනු ලබන මිළ ගණන් දකුණු පළාත තුල භාවිතා කිරීමට තීරණය කරන ලදී.

පහත සඳහන් පරිදි පළාත් මිල කමිටුව අනුමත කරන ලද මිල ගණන් පාදක කර ගෙන ඉතාමත් ඉක්මනින් මිළ ගණන් සාදා ඉදිරිපත් කරන ලෙසට තීරණය විය.

<u>පළාත් මිළ කමිටුව</u>

සභාපති - 1. සුමිත් අලහකෝන් මහතා
ප්‍රධාන ලේකම් - දකුණු පළාත. ..............................

සාමාජික - 2. ඉංජි. සී.බී. අබයදීර මිය.
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( ඉංජිනේරු සේවා)වැ.බ.
දකුණු පළාත. ..............................
අ.පි.බ.

3. එන්.එම්.ආනන්ද අමරදේව මහතා. ..............................
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( මූල්‍ය කළමණාකරන)
දකුණු පළාත.

4. පී.පී. වික්‍රමසිංහ මිය. ..............................
සමාන්‍යාධිකාරී
පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය.

5. ඉංජි. ඩී.ජී.අයි.ඒ. තිලකරත්න මහතා. ..............................
රජයේ මාර්ග සංවර්ධන අධිකාරිය.

6. ඉංජි. එල්.අයි. රාමනායක මහතා. ..............................
පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව.

7. ඉංජි. එම්. ජී. ඒ.ඩී.දිසානායක මහතා. ..............................
යාන්ත්‍රික ඉංජිනේරු,
මහා නගර සභාව , ගාල්ල.

8. ඉංජි. ජේ.ජී. ජනත් මහතා. ..............................
විදුලි ඉංජිනේරු,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු සේවා කාර්යාලය,
දකුණු පළාත.